වගා සහනාධාර චක්‍රලේඛ අංක - 37

මගේ අංකය: සං/04
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474, කොළඹ.03.
1992 මැයි මස 14 වන දින

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

**නියඟයෙන් හානියට පත් 1990 සහ 1991 වර්ෂවල තේ වගා කරන ලද අවසරපත්‍ර යටතේ සහන සැලසීම**

මෙම වර්ෂයේ මුල් මාස හතර තුල පැවති දැඩි නියඟය නිසා අවසරපත්‍ර යටතේ 1990 සහ 1991 වර්ෂවල තේ පැල සිටුවන ලද ඉඩම්වලට සිදුවී ඇති හානි වෙනුවෙන් පහත දැක්වෙන සහනයන් ලබා දීමට තීරණය කර ඇත.

1. **වගා සහනාධාර ක්‍රම යටතේ ගෙවීම්**

1990 සහ 1991 වර්ෂවල තේ පැල සිටුවන ලද ඉඩම් වෙනුවෙන් තේ වගා කිරීමේ වාරිකය සහ වගා කිරීමෙන් පසු වර්ෂයක් තුල නඩත්තු කිරීමේ වාරිකය සඳහා වූ ප්‍රමිතීන් නියං සහන සැලසීම පිණිස පහත දක්වා ඇති පරිදි අඩු කරනු ලබන අතර, ඒ අනුව ඊට අදාල ගෙවීම් කළ යුතුය.

| ඉඩදී ඇති පාළු ප්‍රතිශතය (මුළු පැල ගණනින්) | ගෙවීම |
|---|---|
| I. 5% සිට 25% තෙක් | වාරිකයට හිමි සම්පූර්ණ සහනාධාර මුදල |
| II 26% සිට 50% තෙක් | වාරිකයට හිමි සහනාධාර මුදලින් භාගයක් (50%) |
| III 50% කට වැඩි | වාරික ගෙවීම් කිසිවක් හිමි නොවේ. |

ඉහත දැක්වෙන ප්‍රමිති ලිහිල් කිරීම 1990/91 වර්ෂවල තේ පැල සිටුවා ඇති අවසරපත්‍ර යටතේ 1992 පළමු මාස හතරතුල පැවති නියඟය නිසා හානියට පත් ඉඩම් වෙනුවෙන් පමණක් අදාලවන බව සැලකිය යුතුය. කවර වර්ෂයක නිකුත් කළ අවසරපත්‍රයක් වුවද ඉහත අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් මෙම සහන සඳහා හිමිකම් ඇත.

2. **විශේෂ නියං සහනාධාර ගෙවීම**

I. 1990 සහ 1991 වර්ෂවල තේ වගා කරන ලද තේ පැල වෙනුවෙන් ගෙවීම් කර ඇති හෝ ගෙවීමට හිමිකම් ලබා ඇති අවසරපත්‍ර සඳහා හෙක්ටයාර් එකකට රු. 10,000 බැගින් පහත දැක්වෙන පරිදි විශේෂ නියං සහනාධාරයක් ගෙවිය යුතුය.

(i) වාරිකය හෙක්./රුපි. 4000 පරීක්ෂණයකින් තොරව වහාම ගෙවීමට
(ii) වාරිකය හෙක්./රුපි. 3000 පාළු පැල සිටවූ බව සනාථ කිරීමෙන් පසුව.
(iii) වාරිකය හෙක්/රුපි. 3000 පාළු සිටවූ පැල නඩත්තු කිරීමට.

මෙම මුදල අනුමත සහනාධාර මුදලට අතිරේකව කරනු ලබන විශේෂ ගෙවීමකි.

II. ඉහත සඳහන් හෙක්./රුපි. 4000 බැගින්වන් ගෙවීමට නොපමාව කළයුතු බැවින් මේහි අමුණා ඇති ආකෘතිපත්‍රය මගින් තොරතුරු සටහන් කරගෙන ගෙවීම් කිරීමට කටයුතු කරන්න. ආකෘතිපත්‍රයේ ඉඩමේ පිහිටීම යටතේ දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා කේත අංකය පමණක් යෙදීමට පුලුවන. ඔබ යොදන කේත අංකය සහ ඊට අදාල දිස්ත්‍රික්කය/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහන් කර එවීමට අවශ්‍යය.

සහන ගෙවීමට සුදුසුකම් ලබන සියලු අවසරපත්‍ර පිළිබඳ තොරතුරු මෙම ලේඛණයට ඇතුළ අවශ්‍යය.

III. ගෙවීම් කිරීම පිණිස ලේඛණයේ දැක්වෙන එක් එක් අවසරපත්‍රය යටතේ වවුචර්පත් පිලියෙළ කර සහනාධාර ගෙවීම් කරනු ලබන ආකාරයටම කටයුතු කරන්. . සෑම ගෙවීමක්ම තුඩා තේ වතු සංවර්ධන සමිති මඟින්ම කිරීමට අවශ්‍යය. ගෙවීම් කිරීමට ප්‍රමාණවත් සමිති නොමැති ස්ථාන සඳහා ඉතා ඉක්මණින් නව සමිති ඇති කිරීමට කටයුතු යොදන්න.

IV. ගෙවීම් කරනු ලබන ලේඛණයේ පිටපතක් ඔබ විසින් සහතික කොට මා වෙත එවිය යුතුය. අදාල ගෙවීම් සම්බන්ධයෙන් යම් පැමිණිල්ලක් ඉදිරිපත් වුවහොත් අප්‍රමාදවම එකී ගොනුව ඔබ භාරයට පත් කර ගෙන පරීක්ෂා කර වාර් ය යුතුය.

V. ඔබ කාර්යාලයේ නියං සහන පළමු වාරිකය ගෙවීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය හැකි ඉක්මණින් මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. ඒ අනුව අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සපයන අතර, මුදල් ප්‍රතිපාදන ලැබී හැකි ඉක්මණින් අදාල ගෙවීම් කිරීම සඳහා කටයුතු කළ යුතුය. මෙම ගෙවීම්වලට ප්‍රමුඛත්වය ලබා දීම අවශ්‍ය බව සැලකිය යුතුය.

VI. මෙම සහන සැලසීම සඳහා ලේඛණ පිලියෙළ කිරීම, පරීක්ෂා කිරීම සහ මුදල් ගෙවීම වෙනුවෙන් දිරි ගැන්වීමේ දීමනාවක් ගෙවනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් වෙනම උපදෙස් දෙනු ලැබේ.

(ශාන්ත කරුණාතිලක)
සභාපති

පිටපත්:-
1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ව්‍යාප්ති)
2. මුදල් කළමනාකරු
3. සහකාර සාමාන්‍යාධිකාරි(පාලන/පිරිස්)
4. අභ්‍යන්තර විගණක
5. ප්‍රධාන කාර්යාලයේ සියලුම මණ්ඩලික නිලධාරීන්
6. සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්.

ශ්‍රී/05/13